# දාගැවිල්ල කිරි අම්මා නොසිඳෙන දිය උල්පත පත්තිනි මෑණියන්ගේ හාස්කමක් ද?

පී.පී.ටී.එම්. පහලගෙදර[1], එච්.ඒ. කරුණාරත්න[2], කේ.එම්.යූ.එච්. බණ්ඩාර[3]

මාතලේ ලග්ගල දාගැවිල්ල ග්‍රාමයේ ඉපැරණි කිරි අම්මා උල්පත පාරිසරික, පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත වන අතර මෙය ශුෂ්ක පරිසරයකට උරුමකම් කියූව ද දිය උල්පත හා රක්ෂිත වන ලැහැබ නිසා සෞම්‍යයත්වයක් උසුලන පාරිසරික උරුමයකි. පත්තිනි පුරාවෘත්තය හා සබැඳුණු මෙම උල්පත ආශ්‍රිතව පත්තිනි මෑණියන්ගේ වාසභූමිය වූ බවත් ගැමියන්ට එදා මෙදාතුර පිහිටාරක්ෂාව ලබාදෙන බවත් ඔවුන්ගේ විශ්වාසයයි. මෙම අධ්‍යයනයේ ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික හා ද්විතීක දත්ත උපයෝගී තරගන්නා ලදී. ගැමියන්ගේ අත්දැකීම් අනුව දිනයේ පූර්ව භාගයේදී පිටිකොටන, රෙදි අපුල්ලන ශබ්දත්, සුදුවතින් සැරසුණු කාන්තාවක් ඉඳහිට සැරිසරන බවත් කිය වේ. පත්තිනි දෙවියන්ට භාරහාරවීම සඳහා පැරන්නන් විවිධ චාරිත්‍ර ඉටුකිරීමට භාවිත කළ කිරිඅම්මා උල්පත නොකඩවා බුබුළු දමමින් ජලය මතුපිටට මුදාහරිනු ලබයි. මින් ගන්නා ජලයෙන් වර්තමානයේදී, එහිදීම කිරි ඉතිරීම, පහන් දැල්වීම, හා දේව රූප පූජා කිරීමෙන් භාරහාර ඔප්පුකර, ජීවන සුභසිද්ධිය ප්‍රාර්ථනා කරයි. ඒ අනුව කන්නාරම්භයේදීම එම කිරිදිය ඉසිමින් කෙත්වතුවල සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කරති. එමෙන්ම වැසි පතමින් ද කිරි ඉතිරීම සිදුකරනු ලබයි. ජනප්‍රවාදවලට අනුව අතීතයේ දී පත්තිනි මෑණියන් විසින් රන් දැකැති දුසිමක් ලබාදුන් බවත්, ක්‍රියාව අවසානයේ දී ඒවා එම ස්ථානයේම තබා යායුතු බවත් පුරාණ ජන විශ්වාසයයි. පුද්ගලයෙක් දැකැත්තක් සොරාගැනීම නිසා මෙය වර්තමානයේදී දක්නට නොලැබෙන බව ද ගැමියන්ගේ මතයයි. ලෙඩරෝග සුවකිරීම ද එක් සුවිශේෂී පැතිකඩකි. අත්දැකීම් අනුව චර්ම රෝගයකට දීර්ඝ කාලීනව වෙදකම් කිරීමෙන් සුවනොවූ පුද්ගලයෙකු කිරි අම්මා උල්පතට භාර වීමෙන් පසුව පූර්ණ සුවයට පත්ව තිබේ. එමෙන්ම භාරහාර කිරීමේදී බුලත් කොළයක් මත පඬුරක් තබා දිය උල්පතෙහි තැබූ විට එය වට තුනක් ගමන් කර, ප්‍රාර්ථනාව ඉටුවන්නේ නම් පඬුරු සමගම බුලත් කොළය උල්පත තුළට ඇදගනී. කෙතරම් පඬුරු උල්පත තුළට ඇදගත්ත ද එහි කිසිදු වෙනසක් සිදුනොවීම පුදුම සහගත වේ. පෙරදී පුද්ගලයෙකු කුකුල් කදක් ගෙන යන අතරතුරදී උල්පතෙහි දිය පරිභෝජනය කිරීමෙන් පසුව ඔහු අතුරුදහන් වූ බව ද පැවසේ. එමෙන්ම මෙම රක්ෂිතයේ සිදු කිරීමට උත්සහ කළ අනවසර ඉදිකිරීම් ද අසාර්ථක වී තිබේ. හමුවූ සාක්ෂිවලට අනුකූලව නොසිඳෙන කිරිඅම්මා උල්පත වැදගත් පාරිසරික වටිනාකමකින් යුතු අස්පර්ශිත උරුමයකි. මෙහි පවතින පත්තිනි දේව මෑණියන්ගේ හාස්කම් ප්‍රත්‍යක්ෂ වූවන් දක්වන මත අනුව එය මිත්‍යාවක්ය යන මතය බැහැර කිරිමට සිදු වේ. එහෙත් අතීතයේ සිටම මෙහි පැවති කිසියම් භූ විද්‍යාත්මක සුවිශේෂිත්වයක් නිසා මිනිසුන්ට අවබෝධ කරගැනීමට නොහැකි අයුරින් සිදු වූ විවිධ පරිසරාත්මක සිදුවීම් හේතුවෙන් පැරන්නන් විසින් මෙයට දේවත්වයක් ආරෝපණය කර තිබේ ද යන්න විමර්ශණය කිරීම වැදගත් වේ.

ප්‍රමුඛ පද : කිරිඅම්මා දිය උල්පත, පරිසරය, පත්තිනි, විශ්වාස

---

[1 2] සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.thakshila.madubashani1996@gmail.com

[3] පාරිසරික කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. uthpala96617@gmail.com